# ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත පිළිබඳ වැදගත් තොරතුරු


HSBC Credit Card.
The One Card for Home and Away.




HSBC

Issued by The Hongkong and Shanghai Banking Corporation Limited - Sri Lanka. [illegible]

# පටුන

| | |
|---|---|
| ගනුදෙනුකරුගේ තෘප්තිමත් භාවය සහ ප්‍රතිචාර | 03 - 05 |
| ගාස්තු ගණනය කිරීම පිළිබඳ පාරිභෝගික මගපෙන්වුම | 06 -11 |
| ක්‍රෙඩිට් කාඩ්පත් ගෙවීම් සඳහා නියමිත වේලාවන් | 12 |
| ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා ප්‍රකාශන සැලැස්ම | 13 - 15 |

# ගනුදෙනුකරුගේ තෘප්තිමත් භාවය සහ ප්‍රතිචාර

## ඔබට සවන්දීම

## අපගේ කැපවීම ඔබට සේවය කිරීමටයි

ඔබේ බැංකු කටයුතු සඳහා HSBC තෝරාගැනීම පිළිබඳව ස්තුතියි.

ලෝක-තත්ත්වයේ උසස් සේවා මට්ටම සහ කාර්යක්ෂමතාව සමග ඔබට අවශ්‍ය සැලසුම් හා සේවාවන් ඔබ වෙත පිරිනමන්නට HSBC හි අප ඇප-කැප වී සිටිමු.

අපගේ සේවාවන් පිළිබඳ කිසියම් කරුණක් සම්බන්ධයෙන් ඔබ සම්පූර්ණයෙන් සෑහීමකට පත් නොවන්නේ නම්, ඒ පිළිබඳව හැකි ඉක්මනින් අප දැනුවත් කරන්න. ගැටලුව විසඳීම සඳහා එම තොරතුරු අප විසින් භාවිත කරනු ඇති අතර, එවැනි යමක් නැවත සිදුවීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීමට ද කටයුතු කරමු.

ඔබ, අපට වැදගත් වන අතර, අපගේ සේවා මට්ටම වැඩිදියුණු කරගැනීමට ඔබගේ ප්‍රතිචාර අපට උපකාරී වේ.

**ඔබේ ගැටලු ඉදිරිපත් කිරීම**

ඔබේ ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස, අපගේ ශාඛාවන් හි පාරිභෝගික සේවා කාර්ය මණ්ඩලයක් සිටින අතර, ඇමතුම් මධ්‍යස්ථානයක් ද අප සතු ය. ඔබ සෑහීමට පත්වන ආකාරයෙන් ගැටලු විසඳීමට ඔවුන් සියලු උත්සාහයන් දරනු ඇත.

කෙසේ වෙතත්, ඔබ වෙත සේවාවන් සැපයෙන ආකාරය සම්බන්ධයෙන් ඔබ පූර්ණ වශයෙන් සතුටට පත් නොවේ නම්, හෝ අපගේ සැලසුම් මගින් ඔබගේ අපේක්ෂාවන් ඉටු නොවේ නම්, කරුණාකර ඔබේ ගැටලුව පහත පරිදි අප වෙත යොමු කරන්න.:

- ඔබේ ප්‍රතිචාර මාර්ගගතය (online) හරහා එවන්න.
- තැපැල් මගින් ඔබේ ගැටලුව එවන්න

  කළමනාකරු - පාරිභෝගික අත්දැකීම් සහ සබඳතා
  පාරිභෝගික බැංකුකරණ සහ වත්කම් කළමනාකරණ
  HSBC මධ්‍යස්ථානය
  525 යුනියන් පෙදෙස
  කොළඹ 02

  හෝ

- විද්‍යුත් තැපැල් ලිපියක් එවන්න

  **Premier – premiercustomerssolutions@hsbc.com.lk**

  **Advance – advancecustomersolutions@hsbc.com.lk**

  **පොදු – customersolutions@hsbc.com.lk**

  රහස්‍ය භාවය සහ ආරක්ෂණය තහවුරු කිරීම සඳහා, පුද්ගලික අන්තර්ජාල බැංකුකරණය ඔස්සේ සුරක්ෂිත පණිවුඩයක් හරහා වුවද අප වෙත ලියන්නට ඔබට පුළුවන. වම්පස මෙනුවෙහි ඇති "Contact Centre – Send Message" මත Click කරන්න.

- **අමතන්න**

  ඔබ වෙනුවෙන්ම කැපවුණු පාරිභෝගික විසඳුම් ක්ෂණික ඇමතුම් අංකය: +94 114 511 566

- **අපගේ ශාඛාව වෙත පැමිණෙන්න**

  අපගේ ඕනෑම HSBC ශාඛාවක් වෙත ගොස් ශාඛාව භාර කළමනාකරු හමු වී කථා කිරීමේ හැකියාව ඔබට ඇත. නැතිනම්, "ඔබේ අදහස්වලට සවන්දීම" නැමති පෝරමයෙහි ඔබේ අදහස් ලියා අප වෙත ලබාදෙන්න.

  ඔබගේ සබඳතා කළමනාකරු හෝ අපගේ ශාඛා කාර්ය මණ්ඩලයේ අයෙකු සමඟ වුවද සෘජුව කථා කිරීමේ හැකියාව ඔබට ඇති අතර, ඔවුන් ඉතා සතුටින් ඔබට අවශ්‍ය සහය ලබාදෙනු ඇත.

  **සේවා මට්ටමේ කැපවීම**

  ඔබේ ගැටලුව ඉක්මනින් විසඳීමට අපට නොහැකි නම්, ඔබගෙන් තොරතුරු ලද දින සිට වැඩකරන දින තුනක් ඇතුළත අප විසින් ඔබ වෙත විසඳුමක් ලබා දෙන්නෙමු.

එසේ වුවද, ඇතැම් ගැටලු ඉතා සංකීර්ණ විය හැකි අතර, විසඳීම සඳහා තරමක වැඩි කාලයක් ගත විය හැකි ය. එවැනි අවස්ථාවක දී, ප්‍රතිචාර දැක්වීමේ කාලයක් පිළිබඳව අප විසින් ඔබ වෙත දන්වා සිටින්නෙමු.

**මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යාලය - ශ්‍රී ලංකාව**

අප වෙත මතු කරන ඕනෑම කරුණක් ඔබ සම්පූර්ණයෙන් සතුටට පත්වන ආකාරයට විසඳීමට අප කැමති වන අතරම, ඔබට මූල්‍ය ඔම්බුඩ්ස්මන් වරයාගේ කාර්යාලය වෙත ලිපියක් ලියා ප්‍රතිකර්මයක් ඉල්ලා සිටිය හැකිය.

2012 අප්‍රේල් මස ආරම්භ කරන ලද මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ පැකේජයේ කොටසක් ලෙස පිහිටුවන ලද මූල්‍ය ඔම්බුඩ්ස්මාන් කාර්යාලය ස්වාධීන, අපක්ෂපාතී සහ නොමිලයේ ලබාදෙන සේවාවකි.

මූල්‍ය ඔම්බුඩ්ස්මාන් කාර්යාලය හා සම්බන්ධවිය හැකි තොරතුරු;

මූල්‍ය ඔම්බුඩ්ස්මාන් කාර්යාලය - ශ්‍රී ලංකා
143ඒ, වජිර පාර
කොළඹ 05

දුරකථන : +94 112 595 624
ෆැක්ස් : +94 112 595 625
විද්‍යුත් තැපැල් : fosril@sltnet.lk
වෙබ්අඩවිය : www.financialombudsman.lk

## ගාස්තු ගණනය කිරීම් පිළිබඳ පාරිභෝගික මඟපෙන්වුම

### ගෙවිය යුතු අවම මුදල

**4910 13 අංකවලින් ආරම්භ කරන Gold කාඩ්පත් :** ගෙවිය යුතු අවම මුදල වන්නේ, මුළු හිඟ මුදලින් 4%ක් හෝ රු.250.00 ක් හෝ අතරින් ඉහළ වටිනාකම සහිත මුදල.

**අනෙකුත් සියලු ම කාඩ්පත්** : ගෙවිය යුතු අවම මුදල වන්නේ, මුළු හිඟ මුදලින් 4%ක් හෝ රු.500.00 ක් හෝ අතරින් ඉහළ වටිනාකම සහිත මුදල.

### ණය සීමාව ඉක්මවා යෑමේ ගාස්තුව

බිල්ගත කිරීමේ කාලසීමාව තුළ දී ඇති ණය සීමාව ඉක්මවනු ලබන ඕනෑම අවස්ථාවක දී රු.900/-ක සීමාව ඉක්මවීමේ ගාස්තුවක් අය කෙරෙනු ඇත. පරිගණක ගත කිරීමේ දී, ණය සීමාව ඉක්මවා ඇත්තේ ඉහත කී හේතුව සඳහා ද යන්න මත බැංකුවේ ගාස්තු මුදල අයකිරීම සම්බන්ධයෙන් සැලකිල්ලට ගනු ඇත.

### ප්‍රමාද වී සිදුකරන ගෙවීම් සඳහා ගාස්තු

ගෙවීමට නියමිත දිනයේ දී ගෙවිය යුතු අවම හිඟ මුදල ගෙවීමට කාඩ්පත් හිමියා අපොහොසත් වුවහොත්, රු.990.00ක ප්‍රමාද වී ගෙවීමේ ගාස්තුවක් අය කෙරෙනු ඇත.

### මුදල් අත්තිකාරම් ගාස්තු

රු.350/-ක් හෝ 4%ක් හෝ අතරින් ඉහළ වටිනාකම සහිත මුදල් අත්තිකාරම් ගාස්තුවක් සෑම මුදල් ආපසු ගැනීමක් සඳහා ම අය කෙරෙනු ඇත.

**උදාහරණ 1**

| | |
|---|---|
| ලබාගත් මුදල් අත්තිකාරම | = රු.50,000.00 |
| මුදල් අත්තිකාරම් ගාස්තුව 4% | = රු.50,000.00 x 4% |
| | = රු.2,000.00 |
| අය කෙරෙන මුදල් අත්තිකාරම් ගාස්තුව | = රු.2,000.00 |

**උදාහරණ 2**

| | |
|---|---|
| ලබාගත් මුදල් අත්තිකාරම | = රු.5,000.00 |
| මුදල් අත්තිකාරම් ගාස්තුව 4% | = රු.5,000.00 x 4% |
| | = රු.200.00 |
| අය කෙරෙන මුදල් අත්තිකාරම් ගාස්තුව | = රු.350.00 |

**සැලකිය යුතුයි :** සෑම මුදල් ආපසු ගැනීමක් සඳහා ම රු.350/-ක් හෝ 4%ක් හෝ අතරින් ඉහළ වටිනාකම සහිත මුදල් අත්තිකාරම් ගාස්තුවක් අය කෙරෙනු ඇත.

## මුද්දර ගාස්තු

2016 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි මුද්දර ගාස්තු අය කරනු ලබන්නේ ශ්‍රී ලංකාවෙන් පිටත (අන්තර්ජාලයෙන් සිදු කරන ලද ගනුදෙනු ද ඇතුළත්ව) වෙළඳ මහතුන්ගේ ආයතන මත පදනම්ව ඔබේ ක්‍රෙඩිට් කාඩ්පතින් සිදු කරන ලද ගනුදෙනු සඳහා පමණි. එවැනි සියලු ගනුදෙනු සඳහා අය කරනු ලබන නව මුද්දර ගාස්තුව සෑම රු.1,000.00 ක ට ම රු.25.00 ක් හෝ ඉන් කොටසක් වශයෙන් වනු ඇත.

**පොළී ගණනය කිරීම් පිළිබඳ උදාහරණ**

**සැකිල්ල 1:**

ප්‍රකාශන කාලසීමාව 2020/09/01 - 2020/09/30 (පොළී අනුපාතිකය 18.00% ගොල්ඩ් ක්‍රෙඩිට්කාඩ්)

ඉහත ප්‍රකාශන කාලසීමාව සඳහා ගනුදෙනු

| | |
|---|---|
| ආරම්භක ශේෂය | Rs.150,000.00 |
| **දිනය** | **ගනුදෙනු වටිනාකම** |
| 2020 සැප්තැම්බර් 10 | රු. 10,000.00 |
| 2020 සැප්තැම්බර් 20 | රු. 25,000.00 |
| අවසාන ශේෂය | රු.185,000.00 |

**ගෙවීම කළ යුතු දිනය - 2020/10/22**

**ප්‍රකාශන කාලසීමාව** 2020/10/01 - 2020/10/31 (ගෝල්ඩ් කාඩ්පත් සඳහා පොළී අනුපාතිකය 18.00%)

| **දිනය** | **ගනුදෙනු වටිගනාකම** |
|---|---|
| 2020 ඔක්තෝබර් 10 | රු. 20,000.00 |
| 2020 ඔක්තෝබර් 22 | රු. 15,000.00 |

**ගනුදෙනු සඳහා පොළී ගණනය කිරීම්:**

a) රු.10,000.00 x 1.5% x 12/366 x දින 22 (2020 සැප්තැම්බර් 10 – 2020 ඔක්තෝබර් 01) = රු.108.20

b) රු.25,000.00 x 1.5% x 12/366 x දින 12 (2020 සැප්තැම්බර් 20 - 2020 ඔක්තෝබර් 01) = රු.147.54

පොළී මුදල 1 = (a + b) රු.255.74

**ප්‍රකාශනයේ හිඟ ශේෂය සඳහා පොළී ගණනය කිරීම**

c) රු.185,000.00 x 1.5% x 12/366 x දින 8 (ඔක්තෝබර් 02- ඔක්තෝබර් 09) = රු.727.87

පොළී මුදල 2 = රු.727.87

**ගෙවීම්වලින් අනතුරුව ඊළඟ ප්‍රකාශන දිනය දක්වා පොළී ගණනය කිරීම :**

d) රු.165,000.00 (රු.185,000.00 - රු.20,000.00) x1.5% x 12/366 x දින 12 (ඔක්තෝබර් 10 – ඔක්තෝබර් 21) = රු.973.77

e) රු.150,000.00 x1.5% x 12/366 x දින 11 (ඔක්තෝබර් 22 – නොවැම්බර් 01) = රු.811.48

පොළී මුදල 3 = (d +e) රු.1,785.25

**මුළු පොළී එකතුව = පොළී මුදල 1 + පොළී මුදල 2 + පොළී මුදල 3**

**=255.74+727.87+1,785.25 = 2,768.86**

**සැකිල්ල 2:**

**අවම මුදල ගෙවූ විට, මුදල් අත්තිකාරම් සඳහා අදාළ වන පොළී ගණනය කිරීම**

ගෙවීමට නියමිත අවම මුදල ගනුදෙනුකරු විසින් ගෙවන විට (රු.7,416.00 – ඔක්තෝබර් 01 දින වන විට ගෙවීමට නියමිත හිඟ ශේෂයෙන් 4%) ගෙවීමට නියමිත දිනයේ දී (ඔක්තෝබර් 22) ඉහත දක්වා ඇති පරිදි. එසේම, 2020 සැප්තැම්බර් 10 දින ගනුදෙනුව රු.10,550.00 ක මුදල් අත්තිකාරමක් ලෙස {මුළු මුදල රු.10,000.00 x 5% හෝ රු.550 යන අගයන් අතරින් ඉහළ අගය මුදල් අත්තිකාරම් ගාස්තුව වශයෙන් අය කෙරෙනු ඇත. එමනිසා මුදල් අත්තිකාරම + ගාස්තුව = රු.10,550.00}.

**ගනුදෙනු සඳහා පොළී ගණනය කිරීම :**

a) රු.10,550.00 x1.5% x 12/366 x දින 23 (සැප්තැම්බර් 10 - ඔක්තෝබර් 01) = රු.119.34

b) රු.25,000.00 x 1.5% x 12/366 x දින 13 (සැප්තැම්බර් 20 - ඔක්තෝබර් 01) = රු.159.84

පොළී මුදල 1 = (a + b) රු.279.18

**ප්‍රකාශනයේ හිඟ ශේෂය සඳහා පොළී ගණනය කිරීම:**

c) රු.10,550 x 1.5% x 12/366 x දින 20 (සැප්තැම්බර් 02 - ඔක්තෝබර් 21) = රු.103.77

d) රු.175,000.00 x 1.5% x 12/366 x දින 20 (ඔක්තේබර් 02 - ඔක්තෝබර් 21) = රු.1,721.31

(මිලදී ගැනීම් + ඔක්තෝබර් 01 දිනට ආරම්භක ශේෂය)

පොළී මුදල 2 = (c + d) රු.1,825.08

**ඔක්තෝබර් 22 දින පළමු ගෙවීමෙන් පසු සිට ඊළඟ ප්‍රකාශන දිනය දක්වා කාලසීමාව සඳහා පොළී ගණනය කිරීම**

e) රු.3,134.00 (Rs.10,550.00 - රු.7,416.00) 1.5% x 12/366 x දින 11 (ඔක්තෝබර් 22 – නොවැන්බර් 01) = රු.16.95 (මුදල් අත්තිකාරම්)

f) රු.175,000.00 x 1.5% x 12/366 x දින 11 (ඔක්තෝබර් 22 - නොවැම්බර් 01) = රු.946.73

(මිලදී ගැනීම් + නොවැම්බර් 02 දිනට ආරම්භක ශේෂය)

පොළී මුදල 3 = (e + f) රු.963.67

මුළු පොළී මුදල = පොළී මුදල 1 + පොළී මුදල 2 + පොළී මුදල 3

= 279.18+1,825.08+963.67 = **3,067.93**

**සැකිල්ල 3**

ගෙවීමට නියමිත දිනයෙන් පසු ගෙවීම් සිදුකළ විට පොළී ගණනය කිරීම

ගෙවීමට ඇති හිඟ ශේෂයෙන් රු.10,000.00 ක් ගනුදෙනුකරු විසින් ඔක්තෝබර් 24 දින ගෙවනු ලබයි (උදාහරණයට අනුව ගෙවීමට නියමිත දිනය ඔක්තෝබර් 22).

**සැලකිය යුතුයි :** ගෙවීමට නියමිත දින හෝ ඊට පෙර අවම ගෙවීම සිදුකර නොමැති නම්, පොළිය සමග රු.1,200.00ක ප්‍රමාද ගාස්තුවක් ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමට අය කෙරෙනු ඇත.

**ගනුදෙනු සඳහා පොළී ගණනය කිරීම:**

a) රු.10,550.00 x 1.50% x 12/366 x දින 23 (සැප්තැම්බර් 10 - ඔක්තෝබර් 01) = රු.119.33

(මුදල් අත්තිකාරම්)

b) රු.25,000.00 x 1.50% x 12/366 x දින 13 (සැප්තැම්බර් 20 - ඔක්තෝබර් 01) = රු.159.83

පොළී මුදල 1 = (a + b) රු.279.16

**ප්‍රකාශනයේ හිඟ ශේෂය සඳහා පොළී ගණනය කිරීම:**

c) රු.10,400.00 x 1.50% x 12/366 x දින 22 (සැප්තැම්බර් 02 - ඔක්තෝබර් 23) = රු.112.52

(මුදල් අත්තිකාරම්)

d) රු.175,000.00 x 1.50% x 12/366 x දින 22 (සැප්තැම්බර් 02 - ඔක්තෝබර් 23) = රු.1,893.44

(මිලදී ගැනීම් + ඔක්තෝබර් 01 දිනට ආරම්භක ශේෂය)

පොළී මුදල 2 = (c + d) රු.2,005.96

**සැප්තැම්බර් 24 දින පළමු ගෙවීමෙන් පසු සිට ඊළඟ ප්‍රකාශන දිනය දක්වා කාලසීමාව සඳහා පොළී ගණනය කිරීම**

e) රු.550.00 (රු.10,550.00 - රු.10,000.00) x 1.50% x 12/366 x දින 9 (සැප්තැම්බර් 24 - ඔක්තෝබර් 01) = රු.2.43 (මුදල් අත්තිකාරම්)

f) රු.175,000.00 x 1.50% x 12/366 x දින 9 (සැප්තැම්බර් 24 - ඔක්තෝබර් 01) = රු.774.59

(මිලදී ගැනීම් + සැප්තැම්බර් 01 දිනට ආරම්භක ශේෂය)

පොළී මුදල 3 = (e + f) Rs. 777.02

මුළු පොළී මුදල = පොළී මුදල 1 + පොළී මුදල 2 + පොළී මුදල 3 + ප්‍රමාද ගාස්තු Rs.1,200.00

= 279.16 + 2,005.96+ 777.02+ 1,200 (ප්‍රමාද ගාස්තු) = Rs.**4,262.14**

## ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා ගෙවීම් සිදු කිරීමට නියමිත කාල වේලාවන්

| ශාඛා වෙත දී ගෙවීම් | ගෙවීම් සඳහා නියමිත වේලාවන් | යාවත්කාලීන කෙරෙන වේලාව |
|---|---|---|
| චෙක්පත් තැන්පතු* | ප.ව. 2.00 (වැඩකරන දිනයන් හි දී) | උපලබ්ධි වීමෙන් පසු |
| මුදල් | ප.ව. 3.00 (වැඩකරන දිනයන් හි දී) | එසැණින්** |

| EASYPAY / EB මධ්‍යස්ථාන | චෙක්පත්* | මුදල් | යාවත්කාලීන කෙරෙන වේලාව |
|---|---|---|---|
| ගාල්ල ශාඛාව | ප.ව. 3.00 | ප.ව. 3.00 | පෙ.ව. 7.30 (වැඩකරන ඊළඟ දින දී) |
| මහනුවර ශාඛාව | ප.ව. 3.00 | ප.ව. 3.00 | පෙ.ව. 7.30 (වැඩකරන ඊළඟ දින දී) |
| යාපනය ශාඛාව | ප.ව. 3.00 | ප.ව. 3.00 | පෙ.ව. 7.30 (වැඩකරන ඊළඟ දින දී) |
| අනෙකුත් සියලුම ශාඛා | ප.ව. 2.00 | ප.ව. 3.00 | පෙ.ව. 7.30 (වැඩකරන ඊළඟ දින දී) |
| ශාඛාවක පිහිටා නොමැති EASYPAY / ATM යන්ත්‍ර | රාත්‍රි 12ට පෙර | රාත්‍රි 12 | පෙ.ව. 7.30 (වැඩකරන දෙවන දින දී |
| නවම් මාවත සහ ESQ | ප.ව. 2.00 | ප.ව. 3.00 | පෙ.ව. 7.30 (වැඩකරන ඊළඟ දින දී) |
| කොහුවල | ප.ව. 2.30 | ප.ව. 2.30 | පෙ.ව. 7.30 (වැඩකරන ඊළඟ දින දී) |
| ***චෙක්පත් ගෙවීම් ඔබගේ කාඩ්පතට බැර කෙරෙනුයේ අරමුදල් උපලබ්ධි වීමෙන් පසුව ය.** | | | |

| ස්වයංක්‍රීය මාර්ගගතයන් | නියමිත වේලාවන් | යාවත්කාලීන කෙරෙන වේලාව |
|---|---|---|
| **අන්තර්ජාල බැංකුකරණ / දුරකථන බැංකුකරණ** | ප.ව. 5.30 | පෙ.ව. 7.30 (වැඩකරන ඊළඟ දින දී) |
| **ATM හුවමාරු කිරීම්** | එසැණින්** | එසැණින්** |
| **HSBC ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා CEFTS ගෙවීම්** | එසැණින්** | එසැණින්** |
| | | (**නියමිත දිනයන් හි, ප.ව.6.30) |

| වෙනත් ක්‍රමවේද | නියමිත වේලාවන් | යාවත්කාලීන කෙරෙන වේලාව |
|---|---|---|
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ප.ව. 3.00 | පෙ.ව. 7.30 (වැඩකරන ඊළඟ දින දී) |
| කාගිල්ස්/කීල්ස්/ (සුපර් K වෙළඳ ආයතන හැර)/අබාන්ස් / සිංගර් මෙගා ප්‍රදර්ශනාගාර / ආර්පිකෝ සුපර් සෙන්ටර්ස් | ප.ව. 4.00 | පෙ.ව. 7.30 (වැඩකරන ඊළඟ දින දී) |

සති අන්තවලදී සහ බැංකු නිවාඩු දිනයන් හි දී EasyPay යන්ත්‍ර හරහා ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා සිදුකරන ලද මුදල් ගෙවීම්, ඊළඟ දින පෙ.ව. 7.30 වන විට අරමුදල් පවතින්නේ නම්, ඊළඟ දිනයේ දී බැර කෙරෙනු ඇත.

## ක්‍රෙඩිට් කාඩ්පත් ප්‍රකාශන සැලැස්ම

1. **නම සහ ප්‍රකාශන කාලසීමාව**: ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත් ප්‍රකාශනයෙහි නම සහ කාලසීමාව මෙමගින් දැක්වේ.
2. **ගිණුම්ගත දිනය**: ඔබේ කාඩ්පත් ගිණුමට ගනුදෙනු බිල්ගත කෙරෙන දිනයයි මේ.
3. **ගනුදෙනු දිනය**: ඔබේ ක්‍රෙඩිට් කාඩ්පතින් ගනුදෙනුව සිදු කළ නියම දිනය මෙය වේ.
4. **විස්තරය**: ඔබේ ක්‍රෙඩිට් කාඩ්පතින් සිදු කළ සියලු ගනුදෙනු මෙහි දැක්වේ.
5. **මුදල**: එක් එක් මිලදී ගැනීම, මුදල් අත්තිකාරම, ශේෂ හුවමාරු, මාසික වාරික, ලැබුණු ගෙවීම් සහ වෙනත් ගාස්තු සඳහා වන ගනුදෙනු මුදල් මෙහි ලැයිස්තුගත වේ.
6. **ක්‍රෙඩිට් කාඩ්පත් අංකය**: මෙය ඔබගේ ක්‍රෙඩිට් කාඩ්පත් අංකයයි. ගෙවීම් සිදුකරන විට සහ අප සමග සිදුකරන සෑම ලිඛිතව සම්බන්ධවන සෑම අවස්ථාවක දී ම කරුණාකර මෙම අංකය සඳහන් කරන්න.
7. **ගෙවීමට නියමිත මුළු මුදල**: ප්‍රකාශන කාලසීමාව සඳහා වන මුළු හිඟ ශේෂය මෙය වේ.
8. **වාරික සැලසුම**: ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත යටතේ වන වර්තමාන වාරික සැලසුම් මුදල් සහ එක් එක් සැලසුමට අදාළ හිඟ ශේෂයන් මෙහි ලැයිස්තුගත වේ.
9. **රිවෝඩ්ස් සාරාංශය**: අවසාන ප්‍රකාශන දිනය දක්වා ඔබ විසින් උපයන ලද සහ ආපසු භාවිත කළ රිවෝඩ්ස් ලකුණු මෙයින් දැක්වේ. රිවෝඩ්ස් ලකුණු සම්බන්ධයෙන් බැංකුවෙන් කෙටිපණිවුඩ ලැබේ.
10. **ගිණුම් සාරාංශය**: ප්‍රකාශනය දිනය වන විට, පසුගිය ප්‍රකාශනයේ ශේෂය, ගෙවීම් සහ බැර, ප්‍රකාශන දිනය දක්වා මිලදී ගැනීම්, ගෙවීම් සහ බැර, මිලදී ගැනීම් සහ හර ඇතුළත් ඔබගේ සම්පූර්ණ ගිණුම් ශේෂය සහ ගෙවීමට නියමිත වාරික මුදල් ආදිය මෙයින් දැක්වේ.
11. **ගෙවිය යුතු දිනය**: ප්‍රකාශන කාලසීමාව සඳහා ගෙවිය යුතු සම්පූර්ණ හෝ අවම ගෙවීම (4%) මෙම දින හෝ ඊට පෙර ගෙවිය යුතු වේ.
12. **වත්මන් හිඟ මුදල**: ගෙවීමට නියමිත ඔබේ වත්මන් මුළු මුදලින් 4%.
13. **ණය සීමාව ඉක්ම වූ ගෙවීමට නියමිත මුදල**: ඔබ වෙනුවෙන් අනුමත කර ඇති ණය සීමාවට වඩා ඔබ විසින් භාවිත කළ මුදල (වේ නම්) මෙමගින් දැක්වේ.
14. **ගෙවීමට නියමිත පසුගිය මුදල**: ගෙවීමට නියමිත දිනයේ දී සිදු නොකරන ලද කාඩ්පත් ගෙවීම (වේ නම්) මෙමගින් දැක්වේ.
15. **ගෙවිය යුතු අවම මුදල**: ඔබගේ ගෙවිය යුතු වත්මන් මුදල සහ දී ඇති ණය සීමාවට වඩා භාවිත කළ මුදල/ගෙවීමට නියමිත දින සිදු නොකරන ලද මුදල (වේ නම්) මීට ඇතුළත් වේ.
16. **ණය සීමාව සහ පොළී අනුපාතික**: ඔබේ වර්තමාන ණය/මුදල් සීමාව, දැනට භාවිත කළ හැකි ණය සීමාව සහ ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත මත අදාළ වන වත්මන් පොළී අනුපාතික මෙමගින් දැක්වේ.
17. **අපගේ වර්තමාන අලෙවි ප්‍රවර්ධන සම්බන්ධ නවතම තොරතුරු**: බැංකුව වෙතින් ලැබෙන පණිවුඩ මගින් වර්තමාන අලෙවි ප්‍රවර්ධන දැනුම් දෙනු ලැබේ.
18. **ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුම සම්බන්ධ යාවත්කාලීන කිරීම්**: ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත සඳහා ගෙවීම් සිදුකරන විට භාවිත කළ හැකි ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත් ගෙවීම් පත්‍රිකාවෙහි බැංකුව විසින් දක්වනු ලබන පණිවුඩය.
19. **ගෙවීම් පත්‍රිකාව**: ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත සඳහා ගෙවීම් සිදුකරන විට භාවිත කළ හැකි ය.

HSBC

## HSBC Credit Card

The Hongkong and Shanghai Banking Corporation Limited
HSBC Card Centre P.O. Box 73, Colombo.

Page 1 of 1

**CONTACT US**
Customer Service +94 11 4 4722 00

**First Name Last Name** (1)
Statement From XX XX XXXX to XX XX XXXX

| (2) POST DATE | (3) TRAN DATE | (4) DESCRIPTION | (5) AMOUNT (LKR) |
|---|---|---|---|
| **First Name Last Name 1234-XXXX-XXXX-5647** (6) | | | |

**REWARDS SUMMARY** (9)
Previous Earned Points
Points Earned
Points Redeemed
Total Points Balance

**ACCOUNT SUMMARY** (10)
Previous Statement Balance
Payments & Credits
Purchases & Debits
Outstanding Instalments
Total Account Balance

**PAYMENT SUMMARY**
Payment Due Date (11)
Current Due (12)
Overlimit Due Amount (13)
Past Due Amount (14)
Minimum Payment (15)

**TOTAL DUE** (7)

**YOUR INSTALMENT PLAN** (8)

| DATE | EXPIRY | AMOUNT (LKR) | BALANCE (LKR) |
|---|---|---|---|

**CREDIT LIMIT AND INTEREST RATES** (16)
Credit Limit
Cash Limit
Available Credit
Annual Interest Rate
Purchase
Cash Advance

**Updates on your credit card account.** (18)

**Updates on our Current marketing promotions.** (17)

PLEASE DETACH AND RETURN THIS LOWER PORTION TOGETHER WITH YOUR PAYMENT.

(19)

HSBC
The Hongkong and Shanghai Banking Corporation Limited
HSBC Card Centre P.O. Box 73, Colombo.
Sri Lanka

☐ New contact info? Please check the box and complete reverse side or visit www.hsbc.com

| HSBC Credit Card | 1234-XXXX-XXXX-5647 | | |
|---|---|---|---|
| Total Due | Minimum Payment | Payment Due Date | Amount Paid |

For your convenience, please make your payment via internet banking or other channel shown on the following page.

First Name Last Name
Suite Number, Building Number
Street Number, Street Name
City, State, Country Postal Code

Should you require a translated copy of this document in Sinhala or Tamil languages, please click https://www.hsbc.lk/credit-cards/useful-links/ or request if from any one of our branches.

මෙම ලේඛනයේ ඉංග්‍රිසි හෝ දමිළ භාෂා පරිවර්තනයේ පිටපත් ඔබට අවශ්‍ය නම්, කරුණාකර https://www.hsbc.lk/credit-cards/useful-links/ වෙත පිවිසෙන්න, නැතිනම් අපගේ ඕනෑම ශාඛාවකින් ඉල්ලා සිටින්න.

இந்த ஆவணத்தின் ஆங்கில, சிங்கள பிரதிகள் தேவைப்படின், தயவுசெய்து https://www.hsbc.lk/credit-cards/useful-links/ என்ற எமது இணையத்தளத்தில் பிரவேசியுங்கள் அல்லது எமது கிளையொன்றில் கேட்டுப் பெறுங்கள்.

**CCW/CG/IUCC/2020JUL/Sinhala**